# ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය

## ගෝලීය සත්කාරක අධ්‍යාපනයේ දේශීය සන්නාමය හොබවන අපගේ විශිෂ්ට සාමාජිකයෙකු වන්න

## සහකාර අධ්‍යක්ෂ - තොරතුරු තාක්ෂණ

**(MM 1 - 2 කාණ්ඩය) - කොළඹ**

පහත සඳහන් කර්තව්‍යයන් මනා ලෙස ඉටු කළ හැකි සුදුසුකම්ලත් අයදුම්කරුවන් හට විවෘත වේ.

- සම්මත තත්ත්වයන්ට අනුව ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් කළමනාකරණය කිරීම හා නිසි පරිදි පවත්වාගෙන යාම.
- ආයතනයේ ප්‍රධාන මෙහෙයුම් ක්‍රියාවලියට අදාළ ස්වයංක්‍රියකරණ තොරතුරු පද්ධති සම්බන්ධ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමට නායකත්වය ගැනීම, ස්ථාපිත පද්ධතීන් හා ඉලෙක්ට්‍රෝනික තැපැල් සේවය (email platform) කළමනාකරණය.
- ආයතනයේ පොදු අරමුණු ඵලදායී ලෙස සපුරා ගැනීම සඳහා බාහිර පාර්ශ්වයන් සහ කණ්ඩායම් කළමනාකරණය හා සම්බන්ධීකරණය
- තොරතුරු තාක්ෂණ අංශයේ අයවැය සැලසුම් කිරීම සහ අධීක්ෂණය.
- සේවා සැපයුම්කරුවන්ගේ හා තොරතුරු තාක්ෂණික ආයතනයන්හි KPI, SLA හා AMC තත්ත්වයන් අධීක්ෂණය කිරීම හා ඒ සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- REP, SRS හා CR නිර්මාණය කිරීම හා ඒ සම්බන්ධව කටයුතු කිරීම.

✓ **සුදුසුකම් :**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් තොරතුරු තාක්‍ෂණය පිළිබඳ උපාධියක්

- සහ -

රාජ්‍ය සේවයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක, අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

✓ **වයස :**

වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

✓ **සැම අයදුම්කරුවකුම :**

අ. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

ආ. තනතුරේ රාජකාරි මැනවින් ඉටුකිරීම සඳහා කායිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.

ඇ. ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කැමති විය යුතුය.

ඈ. විශිෂ්ට චරිතයකින් හෙබි විය යුතුය.

✓ **අතිරේක සුදුසුකම් :**

- ව්‍යාපෘති කළමනාකරණ හා මෘදුකාංග යෙදවුම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ඉතා ඉහළ දැනුමක් තිබීම.
- දෘඩාංග හා ජාලකරණයද ඇතුළත්ව තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් පවත්වාගෙන යාම සම්බන්ධව මනා අවබෝධයක් හා පළපුරුද්දක් තිබීම.
- යම් සංවිධානයක් සඳහා සැලකිය යුතු මෘදුකාංග යෙදවුමක් අවම වශයෙන් වසර 01ක කාලයක් ක්‍රියාත්මක කිරීමට සහභාගීත්වය දක්වා තිබීම.
- අභ්‍යන්තර කණ්ඩායම් / බාහිර පාර්ශ්වයන් හා සේවා සැපයුම්කරුවන් කළමනාකරණය පිළිබඳ පෙර පළපුරුද්ද තිබීම.
- අදාළ ක්ෂේත්‍රයේ වසර 05කට වැඩි පළපුරුද්දක් සතුවීම වාසිසහගත වනු ඇත.
- කණ්ඩායම් ක්‍රියාකාරිකයෙකු වීම, ඉහළ සන්නිවේදන කුසලතා (වාචික හා ලිඛිත), මනා විශ්ලේෂණාත්මක කුසලතා, ගැටළු විසඳීමේ හැකියාව හා රාමුවෙන් පරිබාහිරව සිතා කටයුතු කිරීමේ හැකියාව

✓ **ප්‍රතිලාභ :**

වැටුප් පරිමාණය : MM 1-2 - 2016 රු. (54,550 - 10 X 1,375 - 15 X 1,910 - 96,950)

මූලික පියවර : රු.54,550/= + ජීවන වියදම් දීමනාව + මාසික දීමනා

ප්‍රසාද දීමනා හා දිරි දීමනා කාර්ය සාධනය මත ගෙවනු ලැබේ.

01. සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට (EPF හා ETF) දායකත්වය

    අ.) සේ. අ. අරමුදලට සේවකයා විසින් ඒකාබද්ධ වැටුපෙන් 10% බැගින්ද, සේව්‍යයා විසින් 15% කින්ද දායක වනු ඇත.

    ආ.) සේ.භා.අරමුදලට සේව්‍යයා විසින් වැටුපෙන් 3% කින් දායක වනු ඇත.

02. සේවකයා හා ඔහුගේ / ඇයගේ පවුල සඳහා ආකර්ෂණීය වෛද්‍ය රක්ෂණාවරණය.

03. ප්‍රවාහන දීමනාව.

❖ පැයක් ඇතුළත සේවා ස්ථානය වෙත දෛනිකව ළඟා විය හැකි අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය හිමිවේ.

✓ **අයදුම් කිරීමේ ක්‍රමවේදය :**

සම්පූර්ණ ජීව දත්ත විස්තර සහිත අයදුම්පත්, අධ්‍යාපනික සුදුසුකම්, සේවා පළපුරුද්ද ආදියට අදාළ සියලුම සහතික වල පිටපත් සහ ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකු ගේ නම්ද සහිතව ලිපි කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කොට 2024 .02 .26 වන දින හෝ ඊට පෙර පහත අත්සන් කරන අය වෙත ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතුය.

**සැලකිය යුතුයි :** යම් අයදුම්කරුවෙකු වෙනුවෙන් ආයතනය වෙත සිදු කෙරෙන සියලු ආකාරයේ බලපෑම් තනතුර සඳහා නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

අසම්පූර්ණ, ඉහත අවශ්‍යතා සපුරාලීමට අපොහොසත්වන අයදුම්පත් හා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය,**
**නො. 78, ගාලු පාර, කොළඹ 03.**
**සාමාන්‍ය විමසීම් : 011 - 2208300 දිගුව 303/372**

**වැඩි විස්තර සඳහා :** www.slithm.edu.lk